# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,613—1940ක්වූ මැයි මස 10 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ආණ්ඩුව සන්තක ඉඩමක මිනිරන් හෑරීමේ බලය බදුදීමේ දැන්වීමයි.**

මේ 1940ක්වූ ජූනි මස 8වෙනි දින පෙරවරු 10.15ට කළුතර කච්චේරියේදී මෙහි පහත සඳහන් උප ලේඛනයේ විස්තර කරණ ආණ්ඩුව සන්තක ඉඩමේ මිනිරන් හෑරීමේ බලය කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් ආණ්ඩුව සන්තක ඉඩම්වල මිනිරන් හෑරීමේ විධිවිධාන අනුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. බදුදීම පළමුවෙනිවාරයට අවුරුදු 5ට වේ. තවත් අවුරුදු 5ට බද්ද අලුත්කිරීමට බදුගෙන අයට මුලු බලය තිබේ.

3. බදුදීමේ කොන්දේසි කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඉඩම් කච්චේරියේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1940ක්වූ මැයි මස 2වෙනි දින කොළඹ
ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා වෙනුවට.

උප ලේඛනය.

| ඉඩමේ විස්තරය සහ බිම් ප්‍රමාණය. | පිහිටීම. | ප්‍රිමියම් මුදල. රු. | ශ. | බදුමුදල හෝනොත් රෝයල්ටි මුදල. |
|---|---|---|---|---|
| පුස්සෙහේන නමැතිනො. 106 අවසාන සිතියමේ නො. 297 දරණ අක්කර 4කුත් රූඩ් 2කුත් පර්චස් 3ක් බිම් තරම ඇති කට්ටිය | හැගෙනහිර පස්දුන් කෝරලේ දකුණු මහ පත්තුවේ ලිහි යාගෙ | 750 | 0 .. | පළමුවෙනි අවුරුද්දේ සිට පස්වෙනි අවුරුද්ද දක්වා බදු මුදල වෙනුවට ඉඩමේ පතල්වලින් ලැබෙන සියලුම මිනිරන්වලින් සියේට පහෙන් පංගුවක වටිනාකම හෝ මුදලින් රුපියල් 500ක් යන මේ දෙකෙන් වැඩි ගණන රෝයල්ටි මුදල වශයෙන් ගෙවිය යුතුයි. පතල්වැඩ නොකරණ කාලය ඇතුලත අවුරුද්දකට රුපියල් 500ක් බදු මුදල ගෙවිය යුතුයි. |

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ සැටලුමන්ට් කාරණාව, ඒකම :—යක්කල-රදවාන පාරේ 2වෙනි සැතැප්මට අයිතිහරියේ වංගුව පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ සඳහන්වෙන පංගුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නියමාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. A 1,139. ගම—කොස්කඳවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මනන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දවටගහවත්ත | අවුරුදු 3 සහ 10 වයස අඹගස් 2ක්ද, අවුරුදු 10–40 වයස පොල්ගස් 4ක්ද, අවුරුදු 15ක් වයස පුවක්ගස් 5ක්ද, අවුරුදු 15ක කොස්ගහක් සහ අවුරුදු 5ක් වයස ගොඩපර සහක්ද ඇති ඉඩම | කොස්කඳවල පදිංචි නිස්සන්කආරච්චිඅප්පුහාමිලාගේ විලියම් අප්පුහාමි, එම සාරෙහාමි, එම අබිලින්නෝනා, එම චාර්ලිස්, එම පබිලිස්, රණසිංහහෙට්ටිආරච්චිගේ දෙන් සෙලිස්, රණසිංහ සහ කුරුණෑගල හිරියාලේ පදිංචි නිස්සංකආරච්චිඅප්පුහාමිලාගේ පොඩිඅප්පුහාමි | 0 0 6·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හතරවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනම තමුන්ම හෝ හොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය, වම් 1940ක්වූ ජූනි මස 10වෙනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1940ක්වූ මැයි මස 7වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඇල්. ඇස්. බී. පේ‍්‍රරා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පුදුකුඩිඉරුප්පුවේ පාඨශාලාවක් බැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වම් 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,313. ගම—පුදුකුඩිඉරුප්පුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වාවාලෙඩිඔිඉඩම | අවුරුදු 50ක පමන වයස ඇති තල්ගස් දෙකකින් සහ පාඨශාලාගොඩනැගිල්ලකින් යුත් මුවාවක් නැති හිස්ඉඩම | (1) තුරෑ මම්මදු අබුසහිදු, (2) උසන් සහිදු කයිත්පෙන් සත්තමුත්තු, (3) මුහතින් කනි මතාරෑ මෙයියතින්, (4) මතාරෑ මෙයියතින්ගේ සැමියා තාරුම්මා, (5) සෙකිපිච්චෙ තම්පි, පස්දෙනම පුදුකුඩිඉරුප්පුව | 0 1 14·9 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වම් 1940ක්වූ ජූනි මස 12වෙනි දින උදේ 10යේ කනිසමට මන්නාරම් කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1940ක්වූ මැයි මස 2වෙනි දින
මන්නාරම් කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගුනරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—අනුක්කනේ සිංහල මිශ්‍ර පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රී සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

උපුටාගන්නලද 1වෙනි කොටස, ගම් සිතියමේ නො. 2,432. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොලහත්පත්තුවේ මැද්දේකැටියෙකෝරළේ අනුක්කනේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 130 | සේරුගහමුලහේන | හේන .. | අනුක්කනේ පදිංචි එච්. පී. ඇම්. හීංගිරිබංඩා සහ එම කවනිහාමි | 1 0 37 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1940ක්වූ ජූලි මස 3වෙනි දින පෙරවරු 10යේ කනිසමට කුලියාපිටියේ කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1940ක්වූ මැයි මස 3වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇම්. ශ්‍රීකාන්තා,
වයඹ පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රදවිකොටාපුඇලට බිම්තීරයකටද සහ බංගදෙනිය-මන්දලාන පාරට යෑමට පාරක්ද, පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "(203වෙනි පරිච්ඡේදය) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 638 ගම—හම්බාන සහ බොම්බිවිල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හෙලුන්කුලියවත්ත | පොල්වත්ත, අවුරුදු 25ක් වයස ඇති පොල්ගස් 2යි, අවුරුදු 2–5 වයස ඇති ගස් 2ක්ද තිබේ | කොළඹ ග්‍රෙගරී රෝඩ් එකේ පදිංචි එච්. ජේ. පීරිස් නෝනා මහත්මයා | 0 0 6·8 |
| 5 | එම .. | පොල්වත්ත, අවුරුදු 20–30 වයස ඇති පොල්ගස් 9යි, අවුරුදු 2–5 වයස ඇති පොල්ගස් 10ක් තිබේ | එම .. .. | 0 1 4·8 |
| 7 | එම .. | පොල්වත්ත, අවුරුදු 2–10 වයස ඇති පොල්ගස් 3ක් තිබේ | එම .. .. | 0 0 6·2 |
| 9 | ජේනානාවත්ත වතුයාය | හේන, කෙසෙල් පඳුරුද තිබේ .. | මොරටුව පදිංචි සී. පී. ද සිල්වා නෝනාමහත්මයා | 0 2 15·1 |
| 10 | වීරලන්දවත්ත .. | පොල්වත්ත, අවුරුදු 15–20 වයස ඇති පොල්ගස් 2යි, අවුරුදු 3යේ පොල්පැල 1ක් තිබේ | මාරවිල පදිංචි ඩබ්ලිව්. ඇල්බට් ප්‍රනාන්දු මහත්මයා | 0 1 15·1 |
| 12 | එම .. | පොල්වත්ත, අවුරුදු 10–20 වයස ඇති පොල්ගස් 8යි, වයස අවුරුදු 3යේ පොල්පැල 1ක් තිබේ | එම .. .. | 0 0 9·3 |
| 13 | — .. | ගම්සභාපාර .. .. | එම .. .. | 0 0 38·2 |
| 16 | වීරලන්දවත්ත .. | පොල්වත්ත, අවුරුදු 20–35 වයස ඇති පොල්ගස් 56ක්ද, අවුරුදු 2–10 වයස ඇති ගස් 6ක්ද තිබේ | එම .. .. | 1 0 13·7 |
| 17 | එම .. | පොල්වත්ත, අවුරුදු 20–30 වයස ඇති පොල්ගස් 2ක් තිබේ | මාරවිල පදිංචි ඩබ්ලිව්. පී. දබරේරා මහත්මයා | 0 0 2·9 |
| 18 | එම .. | පොල්වත්ත, අවුරුදු 15ක් වයස ඇති පොල්ගස් 1ක් තිබේ | එම .. .. | 0 0 3 |
| 19 | එම .. | පොල්වත්ත, අවුරුදු 20–35ක් ඇති පොල්ගස් 47ක්ද, අවුරුදු 2–10 වයස ඇති පොල්ගස් 6ක්ද තිබේ | මාරවිල පදිංචි ඩබ්ලිව්. ඇල්බට් ප්‍රනාන්දු මහත්මයා | 0 3 37·3 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවෙන් ක්‍රියාකරන අය මගින් 1940ක්වූ ජූනි මස 29වෙනි දින උදේ 9ට හලාවත කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ මැයි මස 6 වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ආර්. බොහිපෙති,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම්.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස රඹුක්කන නානායමේදී වර්ෂ 1940ක්වූ ජූනි මස 17වෙනි දින දවල් 12ට 1935යේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම්කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

වර්ෂ 1940ක්වූ මැයි මස 10වෙනි දින කොළඹ
ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

දීමට යන ඉඩමේ විස්තර.

ප්ලෑනේ අංකය F. V. P. 132. ගම—දෙහිඹෙම්බ.

| කැබෙල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 87B .. | කේ. ඒ. යගපත්හාමි .. | 4 0 0 |

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස බැද්දවල අම්බලමේදී වර්ෂ 1940ක්වූ ජූනි මස 17වෙනි දින අ. භා. 3.30ට 1935යේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම්කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මෙ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

වර්ෂ 1940ක්වූ මැයි මස 10වෙනි දින කොළඹ
ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

දීමට යන ඉඩම්වල විස්තර.

ප්ලෑනේ අංකය F. V. P. 170. ගම—විත්ගෙත්තම.

| කැබෙල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 24 සහ 25 .. | ඇම්. ඊද්දුමාඅප්පු .. | 1 2 2 |
| 29 .. | ඇම්. උක්කුඑතනා .. | 0 2 7 |
| 32 .. | එච්. මුදලිහාමි .. | 0 1 27 |
| 33 .. | රෙන්ගන් .. | 0 2 22 |
| 37 සහ 42 .. | එච්. මුදලිහාමි .. | 1 2 38 |

---

## ආණ්ඩුවේ තේ ඉඩම් බදුදීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජයන්තක තේ ඉඩම්වල 1940යේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රෙජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of Tea bushes" එනම් "තේගස්වල ප්‍රයෝජනගැණීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇණ්විලොපයේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1940ක්වූ ජූනි මස 4වෙනි දින පෙරවරු 10 වනතුරු භාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

5. ඉඩම් කැලෑවට යන්ට නොදී කඩාගැනීමට බදුකාරයා වගකිය යුතුයි.

6. උවමනාකරණ කානු සහ වල්වල් ආදිය කපා ඉඩමේ පස්සෝද දෙලවල්වලට යාම වැලැක්විය යුතුයි.

7. ඒජන්ත උන්නාන්සේගේ බලය ඇති යම් කෙනෙකුට බද්ද අවසානයේදී බදුකාරයා විසින් ඉඩම නිරවුල්ව බාරදිය යුතුයි.

8. මෙම ඉඩම්වල බිම්ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් අන්දමකින් ඉඩම්වල හරි සම්පූර්ණ බිම්ප්‍රමාණය මෙහි පහත සඳහන් බිම් ප්‍රමාණයට වඩා අඩු බව දෙවනු පෙනීගියහොත්, එම වෙනස සියයට 10ක් (10%) වැඩි නූනිනම් බිම් ප්‍රමාණයේ අඩුලුහුඬුකම සම්බන්ධව මුදල් ආපසුගැනීමට හෝ අඩුකරගැනීමට කරණ ඉල්ලීම ආණ්ඩුව විසින් කල්පනාවට ගනුනොලැබේ.

9. කුපන්දීම සඳහා කාරනා තේ පාලකතුමාගෙන් දැනගත යුතුයි.

10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගතහැක.

මැදකෝරළේ.

| නො. | රෙජිස්තර් නො. | ගම. | ඉඩම්වල තොරතුරු. | බිම්ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 .. | SY 474A1, SY 474A2 | බැරැන්දෙනිය .. | .. 2 B. S. P. P. 468 | .. 0 2 4 |
| | | කුරුවිටිකෝරළේ. | | |
| 2 .. | SY 3022 .. | පාතලස්සකන්ද | 33 (කැල්ලක්) F. V. P. 323 | .. 0 0 8 |
| 3 .. | SY 2788 .. | එම .. | .. 25 (කැල්ලක්) F. V. P. 328 | .. 0 2 0 |
| 4 .. | SY 1585 .. | මුරුත්තෙට්ටුවේකන්ද | .. 3 (කැල්ලක්) F. V. P. 391 | .. 1 0 0 |
| 5 .. | SY 2732 .. | එම .. | .. 65 (කැල්ලක්) F. V. P. 391 | .. 1 0 0 |
| 6 .. | SY 2226 .. | ජැලැන්දකන්ද .. | .. 7 (කැල්ලක්) F. V. P. 394 | .. 4 0 0 |
| 7 .. | — .. | එම .. | .. 7 (කැල්ලක්) F. V. P. 394 | .. 2 2 0 |

වර්ෂ 1940ක්වූ මැයි මස 6වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

ඒ. එච්. ගුණතිලක,
සබරගමු පලාතේ මහ ඒජන්තතුමා වෙනුවට.

## අන්‍ය දැන්වීම්.

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ මැදපත්තුවේ අලුත්ගම ගම්පහ පදිංචි කුරුප්පුආරච්චිගේ එබ්‍රාහිස් ගුණසේන වන මම කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු හැටියට පත් කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවාසින් පසු රෙජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලුම්කරන බව එකී 1907වෙනි අංක 1 දරන ආඥාපනතේ 1B ෂැඩියුල්පත්‍රයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

එස්. ඒ. ජී. ගුණසේන.

බන්ඩාරවත්ත, ගම්පහ.
28 මාර්තු 1940.

---

මීගමු දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ දසියපත්තුවේ විතානමුල්ලේ පදිංචි රත්නායකමුදියන්සෙලාගේ පියසේන වන මම රත්නපුර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු හැටියට පත්කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවාසින් පසු රෙජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලුම්කරන බව එකී 1907 අංක 1 දරන ආඥාපණතේ 1B දරන උපලේඛනයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

ර. මු. පියසේන.

1940 මාර්තු 28.
විතානමුල්ල-දිවුලපිටිය.

---

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ කුඹුකේ පදිංචි බැද්දගේ ගබෝසියෝනු වන මම බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවාසින් පසු රෙජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලීම් කරන බව එකී 1907වෙනි අංක 1 දරණ ආඥාපණතේ 1B ෂැඩියුල් පත්‍රයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

19, මාර්තු 1940. බී. ගබෝසියෝනු.
කුඹුක, ගෝනපල, හැඹෑව.

---

මෙහි පහත නම් සඳහන් මහගණපතිකුරුක්කල් රාමලිංගන් අයියාර් වන මම යාපනේ දිස්ත්‍රික්කයට අයත් කාන්කේසන්තුරය සහ චුන්නාගම්හි දෙමළ භාෂාවෙන් කටයුතුකරන නොතාරිස් කෙනෙක් හැටියට දැනුම්දෙමි.

27. 4. 40. M. Ramalinga Iyar.

---

කන්කසන්තුරේ පදිංචි අරමුගම් විනාසිතම්බි වන මම ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් ඔප්පු ලියන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් වශයෙන් කටයුතුකිරීමට අවසර ලබාගන්ට බලාපොරොත්තු වන බව මෙයින් දැනුම්දෙමි.

27. 4. 40. A. Venasithamby.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.